# සම්භාවිතාව

## 30.1 කාර්ය පත්‍රිකාව

01. පහත දැක්වෙන A කොටසේ සඳහන් එක් එක් සසම්භාවී පරීක්ෂණ සඳහා අදාළ නියැදි අවකාශය B කොටසෙහි සඳහන් කුලක අතරින් තෝරා යා කරන්න.

| පරීක්ෂණය (A) | නියැදි අවකාශය (B) |
|---|---|
| a. "වඩුමඩුව"යන වචනයේ අකුරු කුලකය. | a. {1,2,3,4,5,6} |
| b. කාසියක් උඩ දමා ලැබෙන පැත්ත පරීක්ෂා කිරීම. | b. {ඉරිදා, සඳුදා, අඟහරුවාදා, බදාදා, බ්‍රහස්පතින්දා, සිකුරාදා,සෙනසුරාදා} |
| c. පන්තියේ ළමයෙකු අහඹු ලෙස තෝරා ගෙන උපන් දවස නිමානය කිරීම. | c. {ව, ඩු, ම} |
| d. 1 සිට 6 තෙක් අංක යෙදූ දාදු කැටයක් උඩදමා ලැබෙන අගය පරීක්ෂා කිරීම. | d. {(H, H), (H, T), (T, H), (T, T)} |
| e. කාසියක් දෙවරක් උඩ දමා එහි වැටෙන පැත්ත නිරීක්ෂණය කිරීම. | e. {ව, ඩු, ම, ඩු, ව} |
| | f. {H, T} |

02. පහත සඳහන් එක් එක් සසම්භාවී පරීක්ෂණයේ දී ඇති සිද්ධියේ සම්භාවිතාව සෙවීම සඳහා අවශ්‍ය හිස්තැන් සම්පූර්ණ කරන්න.

| පරීක්ෂණය | සිදුවිය හැකි සියළු ප්‍රතිඵල ගණන n(S) | අදාළ සිද්ධියේ ප්‍රතිඵල ගණන n(A) | සිද්ධියට අදාළ සම්භාවිතාව $P(A) = \frac{n(A)}{n(S)}$ |
|---|---|---|---|
| 1 සිට 6 තෙක් අංක යෙදූ දාදු කැටයක් උඩ දමූ විට අංක 3 ලැබීමේ සිද්ධිය. | 6 | 1 | $\frac{1}{\dots\dots}$ |
| එකම වර්ගයේ සර්වසම නිල් පෑන් 3 ක් හා රතු පෑන් 2 ක් සහිත පෙට්ටියකින් අහඹු ලෙස ගත් පෑනක් නිල්පාට වීමේ සිද්ධිය. | .................. | .................. | $\frac{\dots\dots}{\dots\dots}$ |
| චතුස්තලාකාර දාදු කැටයක් අංක 1 සිට 4 තෙක් අංක යොදා ඇත. දාදු කැටය උඩදමූ විට පොළොව සමඟ ස්පර්ශවන අංකය ඔත්තේ සංඛ්‍යාවක් වීමේ සිද්ධිය. | .................. | .................. | $\frac{\dots\dots}{\dots\dots}$ |

# සම්භාවිතාව

## 30.2 කාර්ය පත්‍රිකාව

01. පහත දැක්වෙන වෙන් රූපය තුළ සංඛ්‍යා මගින් දක්වා ඇත්තේ එක් එක් පෙදෙසට අයත් අවයව සංඛ්‍යාව වේ.




මෙම වෙන් රූපය ඇසුරින්

I. $n(A)$ අගය සොයන්න.

II. $n(B)$ අගය සොයන්න.

III. එමගින් $n(A) + n(B) - n(A \cap B)$ ප්‍රකාශනයේ අගය සොයන්න.

IV. $n(A \cup B)$ හි අගය සොයන්න.

V. දැන් ඔබට III හා IV හි පිළිතුරු මගින් එළඹිය හැකි නිගමනය ලියා දක්වන්න.